ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමය (SLWJA)
මාධ්‍යසේවක වෘත්තීය සමිති සම්මේලනය (FMETU)
ශ්‍රී ලංකා මුස්ලිම් ජනමාධ්‍යවේදීන්ගේ සංසදය (SLMMF)
ශ්‍රී ලංකා දෙමළ ජනමාධ්‍යවේදීන්ගේ සන්ධානය (SLTMA)
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය (FMM)

| SLWJ | FMETU | FMM | SLTMA | SLMMF |
|---|---|---|---|---|
| 07773112649 | 0773641111 | 0777312457 | 077749408 | 0777270032 |

2008/11/05.

මාධ්‍ය නිවේදනය

# රාජ්‍ය පාලිත ජාතික රූපවාහිනිය ජනතාව සතු තොරතුරු දැනගැනීමේ අයිතිය අත්තනෝමතික ලෙස වාරණය කරයි.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් 2008/11/04 දින (ඊයේ ) රාත්‍රී විකාශනය කරන ලද 'ඉරා අඳුරු පට' නම් සංවාදාත්මක වැඩසටහන හදිසියේ අත්හිටුවීම, ජනතාව සතු තොරතුරු දැනගැනීමේ අයිතිය බලවත් ලෙස උල්ලංඝනය කිරීමක් බව ප්‍රකාශ කර සිටින අප සංවිධාන, එම සංවාදය අතරමඟ දී මෙසේ වාරණයට ලක් කිරීම දැඩිලෙස හෙළා දකී. එම සංවාදය පැවැතියේ දැනටමත් තියුණු සමාජ කතිකාවතකට නිමිති වී තිබෙන 2008 ඔක්තෝබර් 10 වැනි සිකුරාදා නිකුත් කැරුණු 1570/35 දරන 2007 'පෞද්ගලික රූපවාහිනී විකාශන මධ්‍යස්ථාන නියෝග' නම් අති විශේෂ ගැසට් පත්‍රය පිළිබඳව ය.

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ උපදේශක චරිත හේරත්, කොළඹ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය ධම්ම දිසානායක සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ කැඳවුම්කරු උවිඳු කුරුකුලසූරිය යන මහත්වරුන් සහභාගී වූ මෙම වැඩසටහන කිසිදු හේතුවක් නො දන්වා අතරමඟ දී වාරණය කර දමන ලදී. පෞද්ගලික රූපවාහිනී නාලිකාවන් හි ස්වාධීනත්වය උල්ලංඝනය කරන මෙ වැනි පනතක් සම්බන්ධයෙන් පැවැත්වූ සාකච්ඡාවක්, මෙ ලෙස හදිසියේ වාරණයට ලක්කිරීමෙන්, රාජ්‍ය පාලිත තරගකාරී රූපවාහිනී ආයතනක් විසින් නිදහසේ අදහස් ප්‍රකාශ කිරීම හා ජනතාව ගේ තොරතුරු දැනගැනීමේ අයිතිය සම්බන්ධයෙන් දක්වන නිශේධනාත්මක, අත්තනෝමතික සහ ඒකාධිපති ආකල්පය නැවත වතාවක් තහවුරු වන බව අප සංවිධානවල අදහස යි.

මෙ ලෙස තොරතුරු සහ අදහස් වාරණයට ලක්කිරීමට සදාචාරාත්මක නො වන අයුරින් මැදිහත් වන ආණ්ඩුවකට සහ එ වැනි ආණ්ඩුවක ජනමාධ්‍ය අමාත්‍යවරයකුට අනෙකුත් සියලු පෞද්ගලික රූපවාහිනී නාලිකා ද අත්තනෝමතික ලෙස පාලනය කිරීමට බලතල ලබාදීම මඟින් සිදුවිය හැකි අනර්ථය සහ එහි ඇති භයානක කම මොනවට පැහැදිළි වන බව අප සංවිධාන ඍජුව ම ප්‍රකාශ කර සිටී. එම අති විශේෂ ගැසට් නිවේදනය සම්බන්ධයෙන් මුල සිට ම අප සංවිධාන විසින් දරන ලද ස්ථාවරයේ ඇති නිවැරැදි භාවය මෙම සිදුවීමෙන් ද තදබල ලෙස තහවුරු වේ.

ජනමාධ්‍ය නිදහස උල්ලංඝනය කරන මෙම ගැසට් නිවේදනය වහා ම ඉවත්කරගන්නා ලෙස අපි නැවත වතාවක් ආණ්ඩුවට තරයේ කියා සිටිමු. එසේ ම ජනතාව සතු මූලික අයිතියක් වන තොරතුරු දැනගැනීමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය මුළුමනින් උල්ලංඝනය කරමින් මෙම වැඩසටහන අතරමඟ දී වාරණයට ලක්කිරීමට නියෝග දුන් පුද්ගලයන් කවුද යන්නත් නො පමාව රට හමුවේ හෙළිදරව් කරන මෙන් ආණ්ඩුවට බලකර කියා සිටිමු. එසේ ම මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ද අප සංවිධාන කටයුතු කරන බව වැඩිදුරටත් සඳහන් කර සිටිමු.

සනත් බාලසූරිය 077 363 0000 - උවිඳු කුරුකුලසූරිය 0777 289289
ධර්මසිරි ලංකාපේලි 077 364 1111 - එන්.එම් අමීන් 077 3629999 - ආර්. භාරතී 077 3628888
ශ්‍රී ලංකා මාධ්‍ය මධ්‍යස්ථානය, අංක 1C 1/1, 28 වැනි පටුමඟ, මල් පාර, කොළඹ 07.